ජාතික නිදහස සඳහා රණ ගී ලියූ ගැයූ එස් මහින්ද හිමියන් පිළිබඳව විමසා බලමු

යටත් විජිත සමයේ 1911 දී පමණ ළමා අවදියේදී, මහින්ද හිමියන් මෙරටට පා තැබිණි. (යටත් විජිත සමය ඉංග්‍රීසින්ගේ ඍජු පාලනයට යටත්ව තිබූ 1815 මාර්තු 02 දා සිට 1948 පෙබරවාරි 04 දක්වා කාලය) මෙරටට පා තැබූ අවදියේදී ම ඔහුගේ නෙත ගැටෙන්නේ, යටත් විජිත පාලනයෙන් ජනතාව විඳින අසීමිත වද වේදනාවන්, හා ඒවාට ඉදිරියෙන් ජනතාවගේ බයාදු භාවයත්, ඒවාට යටින් පිබිදෙමින් තිබුණු ජාතික නිදහස පිළිබඳ අනුරාගයත්ය. මහින්ද හිමියන්ගේ කවි වැදගත් වන්නේ, ඒවායින් දේශානුරාගය වර්ධනය කිරීමත් සතුරා පළවා හැරීම සඳහා ජනතාව තුල අභිලාෂයන් ඇතිකිරීමත් නිසාය. අපි ජීවත් වන මෙම අවදියේ විමසා බැලිය යුත්තේ, ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා කලාකරුවා ඉටු කල යුතු සමාජ මෙහෙවර හඳුනා ගැනීම සඳහාය. **(එනම් ජනතාවට විරුද්ධවන සතුරන් නසමින් (හෙලිදරවු කරමින්) ජීවිතය ගෙන යාමයි.)**

සහන ලැබෙන තුරු ලංකා දීපය ට
ගහන ගැහිලි හමුවෙහි සිහවෙසින් සි ට
නහන රුපුන් නහමින් යමි ඉදිරිය ට
මහණ කමත් බණ දහමත් එයි ම ට

උන්වහන්සේ හිමි නමක් වශයෙන් කල්පනා කලේ ලංකාදීපයට සහන ලැබීම ගැනයි. එනම් ලංකාවේ ජනතාවට සහන ලැබීම පිළිබඳවයි. ඉන්පසු උන්වහන්සේගේ කාර්ය භාරය පෙන්වා දෙයි. මෙයින් මහින්ද හිමියන්ගේ සීමාව අපට වටහා දෙයි. උන්වහන්සේගේ මෙම සීමාවේ සිට අවංකවම, මිළ මුදල් වලට, තාන්න මාන්න වලට, යට නොවී සිය පෑන කවිය මෙහෙයවීය. නමුත් මේවා පිටුපසින් එක්තරා පිරිසක් සංවිධානය වී ඒවා ඩැහැ ගත්හ. එනම් සියල්ලම තමන්ගේ වාසිය, නිදහස ලෙස සැලකූ යටත් විජිත පාලනයට දාසව කටයුතු කල, කලිසම ගලවා දමා ආරිය ඇඳුම දවටා ගත් පිරිසයි. මහින්ද හිමියන් වැනි බොහෝ අය ජාතික නිදහස ගැන වෙහෙස දැරුවද, එහි ඵල නෙලාගත්තේ වෙනත් පිරිසකි. නමුත් උන්වහන්සේ, අටපිරිකරට බෝධි පූජාවට ජනතාව යොමු කරන අයට බලවත් පහරකි. එම නිසා අද දවසේ කවියාගේ සීමාව රටකට ජන කොටසකට නොව, ලෝකය තනන ගොඩ නගන ජනතාවගේ යහපත සඳහා දායකත්වය සැපයිය යුතුය.

අද රටේ රූපවාහිනී මාධ්‍යයන් බොහෝය. බොහෝ දෙනා (මැද පංතික) සිය දවසින් වැඩි කාලය ගත කරන්නේ, මේවායින් විකාශනය වන ගීත, නාට්‍ය, චිත්‍ර පටි, හා වෙළඳ දැන්වීම් සමගය. මේවායින් ජනතාවට, ඔවුන් සමාජයේ මුහුණ දෙන ප්‍රශ්ණ පිළිබඳව හිතා බැලීමට ඉඩ සලසන්නේද නැත. ඒවායින් කරනුයේ ජනතාවගේ සිත තුල, සිතීමට බැරි මානසිකත්වයක් ඇති කරනු සඳහා උත්සාහ ගැනීමය. සමහර වැඩ සටහන් වල නිවේදක නිවේදිකාවන්ගේ ගොං කම් නම් හොඳින් ප්‍රදර්ශනය කෙරේ. ශ්‍රී ලංකා බෙල් වෙළඳ වැඩ සටහනක, **"මමත් හරියට පරාක්‍රමබාහු රජතුමා වාගේ නේදැයි"** ළමයෙක් විමසයි. මෙම වෙළඳ දැන්වීම් වලින් සිදුවෙන හානිය පිළිබඳව, වැඩිහිටියන් වන ඔබ හිතනවාද? ඔබේ යුතුකම් ඉටුකරනවාද?

කෙස් ගහ පවා වෙන රටවල මිනිසුන් නේ
උස් නිදහස පිණිස සටනට සැරසෙන් නේ
හිස් මොළ තිබෙද්දිත් මේ වග නොතකන් නේ
ඇස් ගෙඩි දෙකට හෙණ ගැහිලද සිහළුන් නේ

මහින්ද හිමියන් ජාතිවාදී යයි හංවඩු ගසනු ලබන කවියකි මේ. මෙය ලියා ඇත්තේ 1948 ට පෙරද? පසුවද? එහෙත් මෙය වැඩිපුරම ප්‍රයොජනයට ගෙන ඇත්තේ 1948 ට පෙරද? පසුවද? මෙය ලියා ඇත්තේ 1948 ට පෙරය. එනම් ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ, බොහෝ රටවල ජනතාව යටත් විජිත වාදයෙන් මිදීමට, ජාතික නිදහස පිළිබඳ ව්‍යාපාර වලට, වැඩි වැඩියෙන් ඈඳා ගනිමින් පැවතුණු යුගයකය. නමුත් ඒ වන විටත් ජාතික නිදහස, ජනතාව නොමඟට යැවීම සඳහා පාවිච්චි කල ව්‍යාජ සටන් පාඨයක් බව, බොහෝ දෙනා වටහා ගෙන නොතිබුණි. රටේ සියලුම සම්පත් විදේශීය ධනපතියන් හිමි කරගෙන තිබෙන සමයක, ව්‍යාජ ජාතික ප්‍රතිපත්තිය ගැන නන් දෙඩවීම් අද දවසේ ද, අසන්නට නොලැබේද? මෙහිදී උන්වහන්සේ අපේක්ෂා කළේ බහුතර ජනතාව වූ සිංහළයින්, අනිකුත් ජාතීන් සමග එකතුවී කරනු ලබන අරගලයක් පිළිබඳව නොවේද? තවද, මෙම කවි ප්‍රයොජනයට ගෙන ඇත්තේ ජාතිවාදීන්ය. මහින්ද හිමියන්ට, මැක්සිම් ගෝර්කිලා, මීහයිල් ලෙමන්තෙව්ලා, ලූෂන්ලා, ඇන්ටන් චෙකෝෆ්, වැනි සාහිත්‍යයධරයින්ගේ කෘතීන් ඇසුරු කරන්නට ලැබුනේ නම්, එම හිමියන්ගේ ගමන් මග වෙනස් වන්නට තිබුණි.

සාහිත්‍යය උත්සව හා තෑගි

අද දවසේ වාර්ෂිකව නොයෙකුත් උත්සව පවත්වනු ලබයි. රාජ්‍යය ආයතන වලට වඩා, පෞද්ගලික ආයතන, මේවායේ ප්‍රමුඛතාවය ගෙන ඇත. වර්ෂයේ පළවන විවිධ සාහිත්‍යය කෘති තෝරා ඒවායේ කතුවරුන්ට සම්මාන පිරිනමයි. මුදලින් තෑගි පිරිනමයි. ටෙලිනාට්‍යය, චිත්‍රපටි, පිළිබඳවද මෙම ආකාරය ගනී. මේවායේ ප්‍රධාන තැන උසුලන්නේ, ජනතාවගේ ඉඩම් කට්ටි කර විකුණන සමාගම්ය. ඒ නිසා සාහිත්‍යය කරුවා නව නිර්මාණ කරනයේදී, කල්පනා කල යුත්තේ, තමා කටයුතු කරන්නේ, ජනතාවගේ ඉහමොළ සූරාකන මෙවැනි සමාගම්වලින් ලැබෙන මුදල් හා සම්මාන සඳහාද, නැතිනම් ජනතාව තුල සැබෑ සාහිත්‍යය රසාස්වාදනයක් ඇති කිරීමටද යන්නයි.

නමුත් ජනතාවට නම් දකින්නට ලැබෙන්නේ, චිත්‍රපටි වේවා ටෙලිනාට්‍යය වේවා, එකම පිරිසක් සුවපහසු ශාලාවල රැස්වී, බැබලෙන වර්ණවත් ඇඳුම් විලාසිතාවන්ගෙන් සැරසී, මේ සම්මාන හා තෑගි ලබා ගන්නවා නොවේද? මෙම උත්සව වලින් පසු දින ගණනක් බොහෝ දෙනා, කථා බහ කරන්නේ මෙම තෑගි හා සම්මාන පිටුපස ඇති හිතවත්කම් හා අක්‍රමිකතා ගැනය.

පසුගිය සැප්තැම්බර් 13 වන දින ගුරුවරුන්ගේ වැඩ වර්ජනයක් දියත් කර තිබුණි. මේ පිළිබඳව නොයෙකුත් දේවල් ප්‍රචාරය වෙමින් පවතී. පහත සඳහන්වන්නේ 2007-09-14 දිවයින පුවත්පතේ පලවූ කතුවැකියෙකින් කොටසකි.

"පී නෙදුමාරන් විදේශිකයෙකුව සිටිමින් මේ රටට කරන අනර්ථය මෙන් තුන් හාරසිය ගුණයක අනර්ථයක් මේ රටේ ගුරු කැළ කරන බව පෙනෙන්නට තිබේ. ඊයේ ඔවුන් විසින් කරන ලද වැඩ සංකේත වර්ජනය ඒ බව පසක් කර දුන්නේය. ගුරු වැටුප් විෂමතා පිළිබඳව විරෝධය පළ කිරීම සඳහා ගුරු මවුවරුන් සහ පියවරුන් සමස්ථ ලංකා මට්ටමින් (දෙමළ පාසැල් බොහොමයක් හැර) කළ සංකේත වැඩ වර්ජන නිසා ජාතියේ දූ පුතුන් විශාල පිරිසක් අතරමං විය. මෙවැනි සංකේත වැඩ වර්ජන ප්‍රයිවට් බස් මුදළාලිලා සහ දුම්රිය සේවකයින් විසින් කාලයෙන් කාලයට පවත් වනු ලැබේ. එවිට මිනිස්සු සහ පාසල් ළමයි ලක්ෂ ගණනින් මහ පාරවල් වල අතරමං වූහ. එවැනි අවස්ථාවලදී ඒ සියලු දෙනා කරන ප්‍රාර්ථනා ගැන අපි දනිමු. එවැනි නරක ප්‍රාර්ථනා වලට මේ රටේ ගුරු ප්‍රජාව ලක්විය යුතුද? අපගේ වැටහීම නම් ස්ථිර වශයෙන්ම නැති බවය. එහෙත් හිටි හැටියේම කරදරයට ලක්වන මනුෂයින්ගේ සිත් තුළ විවිධ අදහස් හටගත හැකිය. ඒ බව පමණක් මතක් කරමු."

ඉහත ඡේදය විමසීමේදී අපට පෙනී යන්නේ, පුවත්පත් කුවරයාගේ පැත්තෙන්, ගුරු සංකේත වැඩ වර්ජනය හේතුවෙන් පාසැල් ළමයි ලක්ෂ ගණනින් මහ පැරවල අතරමං වන බවයි. ප්‍රයිවට් බස් මුදලාලිලා සහ ගුරුවරු සමාන වන බවයි. බස් මුදලාලිලා වෙනත් අයගේ ශ්‍රමය මත වැජඹෙති. ගුරුවරයා තම ශ්‍රමයෙන් ජීවිතය ගත කරයි. කතුවරයා, බස් මුදලාලිලාට, ගුරුවරයා සමාන කිරීමට උත්සාහ කිරීම, මොන තරම් කුහක කමක්ද? ගුරුවරු ලක්ෂ දෙකක් පමණ වන අතර බස් මුදලාලිලා ලක්ෂ දෙකක් මේ රටේ සිටීද?

ඇතොත් රටට ආදරයක් සිතින් සි පා
අතත් පයත් ඔලුවත් වෙන වෙනම ක පා
කතත් කමත් නැහැ කැත බිය ගතිය එ පා
අයුත්තකට අත් දෙක ඔසවන්න එ පා

අපට පෙනෙන්නේ බොහෝ කලකට පසු, වැටුප් ශ්‍රේණිගත කිරීමක් කල, අදාල බලධාරීන්ට ඉදිරිපත් කර, සාකච්ඡා කර ප්‍රතිඵලයක් නොලද විට ගෙන ඇති තීරණයකි. එයට ගුරුවරු සහභාගිවීම නිරායාසයෙන්ම සිදුවන්නකි. එසේනම් මෙම ලියන අය මහින්ද හිමියන්ගේ ඉහත පැදිය විමසා බලන්නේ නම් යමක් ඉගෙන ගන්නවා ඇත. එනම්, තමන් කවුරුන්ද? තමන් ජනතාව, නොමඟ යැවීම සඳහා ලිවීමට ගොස්, වමතින් දකුණු අත කපා ගැනීම සිදු කර ගන්නවා ද? යන්නයි.

මහින්ද හිමියන් පිළිබඳව විමසීමේදී, බොහෝ දේ ඇතත් මෙහි දක්වා ඇත්තේ පැදි කිහිපයකි.

වනමල් පියලි විල්ලුද බුමුතුරුණු උ ඩ
යන මිනිහෙකුගෙ ගමනින් නෑ ගොවට වැ ඩ
ඇණ උල් තියුණු ගල් මුල්වල මුණත මැ ඩ
පැන යන ගමන හිතවත කොපමණද හැ ඩ

මහින්ද හිමියන්ගේ ජීවිත දර්ශනය ඉහත ඇත්තේය යනු අපගේ වැටහීමයි. යා යුත්තේ, කල යුත්තේ, කුමකටද, කා වෙනුවෙන්ද, යන්න වටහා ගැනීමට ඔබට, හැකියාවක් ඇතැයි අපගේ විශ්වාසයයි.
මේ දිනවල වතුකරයේ වැඩ කරන අයගේ දිනක වැටුප රුපියල් 170 කි. එම වැටුප, ඒදිනෙදා තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට ප්‍රමාණවත්ද? බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට ආනයනය කරන ලද දැවිඩ කම්කරුවන්, ලබා ඇති

නිදහස පිළිබඳව මේ කතුවරු විමසනවාද? අස්වනු පෑගෙන කාලයට, ගොවීන් ණය ගෙවා ගැනීමට නොහැකිව කෙතරම් ලතවෙනවාද? නිදහස පිළිබඳව කථා කිරීමේදී, කම්කරුවන් හා ගොවීන්ගේ නිදහස පිළිබඳව වැඩියෙන් අවධාන යොමු කිරීම කලා කරුවාගේ යුතුකම වන්නේය.

ඉහත, **දුෂ්කර කටුක ගමන් මාර්ගයක ගමන් කිරීම නිදහස** බව මහින්ද හිමියන් පවසයි

"උවදුරු දිගේ යන දිගු මාවත මිසෙක
නිදහස කරා වෙන යන පාරක් කිමෙක"

ලෙස සාගර පලන්සූරිය විමසන්නේද, එම නිසාය.

ගොවියන් වෙතටයි

අහිමිව ගිය ඉඩම යලි අත්පත් කරගන් ට
උපවාසයෙන් හැකි වේවිද ජයගන් ට
වෙයි ආහාර නොලැබුණහොත් මිය යන් ට
පෙළඹෙමු නැවත ඉතිහාසය විමසන් ට

සතුරා සමග කිසි විටෙකත් කථා නැ තී
උඩ රට කැරැල්ලෙදි කිවුවා මතක ඇ තී
සතුරන් පසු පසම මෙතුවක් ගියා ඇ තී
වහලෙක් උනා මිස නිදහස ලබා නැ තී

තමන් හිසට තම අතමය සෙවනැල් ල
කියා කොතෙක් තිබුණත් නැත විමසිල් ල
මෙතෙක් කලක් රජ කෙරුවේ රුවටිල් ල
එනිසා නුඹටමයි ලැබුණේ ලතැවිල් ල

ගොවිතැන් කරන අයගෙන් ජල පාලන ය
උදුරා ගෙන කෙරෙයි නිළධරු පාලන ය
ගොවිතැන නොදත් උපදේශක සායන ය
කරයි විදෙස් වෙළඳුන් හට සාධන ය

යලට මහට නෙව මහ වැහි වහින් නේ
යලට මහට නොව ගොවිතැන් කරන් නේ
නිළධාරීනුත් දෙස්පාලනෙ කරන් නේ
වැහි වහිනා විටයි අස්වනු නෙළන් නේ

වැස්සට තමයි දැන් අස්වනු නෙළන් නේ
නරක් වූ විටයි ගෙදරට ගෙනෙන් නේ
පොහොර මිළත් සුළඟට වැනි ඇදෙන් නේ
ගොවිතැන එපා කරවීමද කරන් නේ

-අපිත්-

මහින්ද හිමියන්ගෙ කවි

පෙර කරුමයේ හැටියට ඔහෙ හිටපල්ලා
යන දරුමයේ සැබැවක් නැත දැනගල්ලා
ලොව උරුමයේ අපටත් හිමි දැය ඉල්ලා
බැරි කරුමයේ කිම සටනට සැරසෙල්ලා

උස් තැන් කපා ඇද මිටි තැන් පිරවීම
උස් මිටි දෙකම වඳ කොට සම කරලීම
උස් මනු දමකි ගතියකි යන පැවසීම
උස් හඬ නගා පතුරව් හැම තැනදීම

කාමුක කුහක ලොකු අයගේ නපුරු කම් න්
බාගෙට මැරී ඉන්නා දුගියාගෙ නම් න්
මාරක විපත් හැම එකටම මුහුණ දෙමි න්
පෝරක හතක නොව දහසක නගිමි පෙම් න්

දනට අණට බලයට පා පහර දෙ ව
ගුණට නැණට දහමට දිවි වුවද දෙ ව
සිතට බසට අනුවම කිරීයෙහි යෙදෙ ව
එවිට ලැබෙන නිදහස් සුවයෙහි රැඳෙ ව

අපේ රටට පිළිමල් වන සතුරු මු ළ
අපේ අයම නම් බිඳිනෙමු උන්ගෙ බ ල
අපේ මුතුන් මිත්තන් මළ සොහොන් ව ල
පිපෙයි එවිට ජාතික අභිමාන ම ල

මුළු වැර යොදා වැඩ කරතොත් ඇතුව හි ත
පුළු වනි අපට බිඳුමට ලොකු අයගෙ මැ ත
කුළු ගෙඩි පහර එක පිට දෙක හෙලත ම ත
පළු පළු නොවන ගොරසැඩි කළු ගලක් නැ ත

අ ල් ලපු ඉඩමෙ දුප්පත් අසරණයා ගේ
පැ ල් පත් කඩා ඇද ගන්නට වැර වේ ගේ
දැ ල් පිට දැල් දමන ධනපති මරුවා ගේ
බෙල් ලට ලණුව නොවැටුණෙ වරද ද? කා ගේ

දුප්පත් අයගෙ සෙවණැල්ලට පවා කි පී
පුප්පන රවන ගොරවන අය සමග හැ පී
මක් කා වුනත් කම් නැති බව සිතා තෙ පී
එක් වව් ! යමව් ! ජාතික සමගියෙන් දැ පී

ලොක්කන් යයි කියන මේ කාමුක හැත් ත
දුක් මිස අපට සැප නො යෙදෙන බව ඇත් ත
නැත්තට නැති වුණත් නොබලා ඒ පැත් ත
එක්වමු අපි අපි ම කරනට කළ යුත් ත

උප න් නෙත් මැරෙන්නෙත් තනිවමයි ලො වේ
එයි න් පිටත්තර වෙන විදියෙකින් නො වේ
අනු න් පිහිට තකමින් යුතුකම හමු වේ
බියෙන් මුළු වදිනු අපහට තරම් නො වේ

සැපති න් තොරව විපතක් නොයෙදෙන්නේ ය
විපති න් තොරව සැපතක් නොයෙදෙන්නේ ය
එහෙයින් විපත හොඳ බව සැලකෙන්නේ ය
මෙය දන් නවුන් වෙත නිදහස එන්නේ ය

ඉටු කොට කළ යුතු යුතුක මි
ලැබුණාත් ලෝකෙන් ගැරහු මි
ඉවසන්නට පුළුවන් න මි
උඹයි මගේ පුතා උතු මි

බියගුලු කම නිවට කම යි
එය නැති නම් පිරිමි කම යි
සිංහල සිතුවිලි මෙහෙම යි
පුත නුඹටත් එය උරුම යි

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙ වී
ඔහු මෙලොවම පහල දෙ වී
රජෙකැයි සලකනු මැන වී

කාටත් හිමි පොදු දේ න ම්
නැති බැරි හිඟ අවහිර ක ම්
මේ දේ මැඩ ගෙන දස්ක ම්
පෑම තමයි සුරු විරු ක ම්

උපුටා ගැනීම්:

☞

දුප්පතුන් ලෙස මෙලොව එළිය දුටු අයටද, ඉපදීම වහල් බවේ මූළ පටන් ගැන්ම හැටියට ගැනුණු අයටද, සුන්දර ජීවිතයක් ලබාදීම සඳහා මෙතැනදී සගයෝ නිර්භයව මරණයට මුහුණ පෑහ.

මිනිසාගේ අති උතුම්ම වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක වරක් පමණකි. අරමුණක් නැතිව ජීවත්වීම නිසා කටුක වේදනාවක් ඇති නොවන සේ, නීච සහ නොවැදගත් අතීතයක් නිසා ලජ්ජාවීමට සිදු නොවන සේ ඔහු ජීවත් විය යුතුය. ඔහු මිය යන විට ඔහුට මෙසේ කීමට පුළුවන් කමක් තිබිය යුතුය. මගේ මුළු මහත් ජීවිතයත් මුළු මහත් ශක්තියත් ලෝකයේ අතිශයින්ම උදාර හා සුන්දර පරමාර්ථය උදෙසා එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබා දීමේ සටන උදෙසා කැප කරන ලදි. ජීවත්වීම සඳහා යුනුසුලු විය යුතුය. කිසියම් හදිසි රෝගයක් හෝ කිසියම් ශෝකාන්විත අනතුරක් විසින් ජීවිතය කෙටි කළ හැකි බැවිණි.

(වානේ පන්නරය ලද හැටි - නිකොලායි ඔස්ත්‍රොව්ස්කි - සිංහල පරිවර්තනය 100 පිටුව)

☞

පොත්වලට ආදරය කරන්න. පොත් ඔබගේ ජීවිතය පහසු කරනවා ඇත. අදහස් හැඟීම් හා සිදු වීම් නැමැති විවිධාකාර කලබල සහිත අවුල් තත්ත්වයන් තුළින් එමග සොයා යාමට මිත්‍රයෙකු මෙන් ඔබට පොත්පත් සහාය වනු ඇත. තමාටත් අනුන්ටත් ගෞරව කරන හැටි කියා දෙනවා ඇත. ඔබගේ හදවත මානව භක්තියෙන් සහ දයාවෙන් පුරවනවා ඇත.

දැනුමෙහි උල්පත වන පොත පතට ආදරයෙන් සලකන්න. වැඩදායක වන්නේ දැනුම පමණි. ඔබ තුළ අධ්‍යාත්මික ශක්තියක් වර්ධනය කළ හැක්කේ දැනුමට පමණි. මිනිසාට අවංකව ආදරය කළ හැකි ඔහුගේ ශ්‍රම ශක්තියට ගරු කල හැකි ඔහුගේ නොනවතින උත්සාහයෙහි හා අධිශ්ඨානයෙහි අනර්ඝ ප්‍රථිඵල උණුසුම් හදවතකින් අගේ කල හැකි බුද්ධිමත් අවංක මිනිසුන් ඇති කල හැක්කේ පොත පතට පමණකි.

(මැක්සිම් ගොර්කි)

ජනතා අධ්‍යන සංගමයේ ප්‍රකාශනයකි.